එවං මෙසුතං, මෙ, (ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ, ප්‍රශස්තාහි විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ බෞද්ධ විදග්ධ ජනප්‍රමුඛ සකල ශ්‍රොතෘජන මනඃප්‍රසාද දායකවූ මේමල්ලිකොවාද සූත්‍රාන්ත ධර්මදෙශනාව) මාවිසින් එවං සුතං, මෙයාකාරයෙන් අසනලද මෙසේ අසනලද මෙසේම අසනලදී: නොහොත්, මෙ, මාගේ; සුතං, ශ්‍රැතිය; හෙවත්, මේ සූත්‍රාන්ත ධර්මදෙශනාවගේ ඇසීම; එවං මෙසේමැයි; එකං සමයං; (ගර්භාවක්‍රාන්ති සමය ජාතිසමය සංවෙගසමය අභිනිෂ්ක්‍රමණසමය දුෂ්කරක්‍රියාසමය මාරවිජය සමය සම්‍යක්සම්බොධි සමධිගමකාල සමය දෘෂ්ටධර්ම සුඛවිහාර සමය අත්තහිත පටිපත්ති සමය පරහිත පටිපත්ති සමය දෙශනා සමය පරිනිර්වාණ සමය යනාදී දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි විශෙෂයෙන් ප්‍රකාසිතවූ සමයන් අතුරෙන් කරුණාකෘත්‍ය සමය සංඛ්‍යාතවූ එක්ධර්මදෙශනා සමයෙක්හි; භගවා, සර්වසුරාසුර කරාලිපාළිනිසෙවිත ශ්‍රීපාදකමල යුගලොපශොභිතවූ බුදුරජාණන්වහන්සේ; සාවත්ථියං, (සවත්ථිනම් ඍෂිහට නිවාසස්ථානවූ හෙයින්ද රන් රිදී මුතු මැනික් මරකත වෛඩූර්‍ය මසාරගල්ල සංඛ ශිලාප්‍රවාලාදි නානාවිධ රත්න ගණාකීර්ණ විස්ඵුරණ වානිජාපන ශ්‍රෙණීන් සමලඞ්කෘත හෙයින්ද ශාලිව්‍රීහි යවකඞ්ගු කුද්‍රූසවරක ගොධූම යන සප්තවිධ ධාන්‍යයෙන් සම්පූර්ණ හෙයින්ද ක්ෂෞම කොසෙය්‍යාදි විචිත්‍රපට්ට වස්ත්‍රයෙන්ද අනිකුදු මනුෂ්‍යයන්ට ප්‍රයොජනවත්වූ මධුරාහාර පානවර්ගාදිවූ සියලු උපකරනයෙන් සම්පූර්ණ හෙයින්ද "සර්වමස්ති"යි යුතු තන්හි නෛරුක්තික විධියෙන් "ශ්‍රාවස්ති"ය යන නමින් ප්‍රසිද්ධවූ පුරන්දර පුරාකාර කොශල දෙශතිලකායමානවූපැවැත්මෙන්යුත්)සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, (ජෙතනම් රාජකුමාරයාවිසින් රොපිත සංවර්ධිත හෙයින්) ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, (සියලු අනාථානාථ යාචකයන්ට නියමකොට දෙනලද බත්වැටුප් ඇතිහෙයින් අනාථ පිණ්ඩිකනම්වූ සුදත්තාපර නාමධෙයක්ඇති මහාදානපතිවූ) අනෙපිඩුමහ සිටුනුවිසින් (සිව්පණස් කෙළක් ධනවියදම්කොට) කරවා පිළිගන්වනලද ජෙතවනාරාමයෙහි; විහරති, (වෛනෙය ජනයන්ට ධර්ම

දෙශනා කිරීමෙන්ද නානාප්‍රකාර සමාපත්තියට සමවැදීමෙන්ද සත්වයන් ටහා තමන්වහන්සේට විවිධවූ හිතසැප එලවමින් ස්ථාන ගමන සයනාස නාදි චතුර්විධ ආයඝ්‍යීර්යඝ්‍යාපථ බ්‍රහ්මවිහරණයෙන් යුක්තව) වැඩවාසය කරවදාරණ සේක.

(2) අථඛො, ඉක්බිත්තෙන් හෙවත් එකල්හි; මල්ලිකාදෙවී,(නෛකප්‍රකාර රාජ්‍යශ්‍රී සමුර්ධින් ප්‍රසිඛ කොසොල් රජහට අග්‍රමහෙසිකා භාවොපපන්නවූ අනන්‍යසාධාරණ ශ්‍රද්ධාබුද්ධි මහිමනාවන් ඇති) මල්ලිකාදෙවී තොමෝ; භගවා, (සමෛශ්චර්‍ය්‍ය්‍යීපූර්ණ්‍යයශශ්‍රී සංකල්ප සිඞ්ප්‍රයත්නාය යන ෂාඞ්ගුණ්‍යතායෙන් පරමොත්කෘෂ්ටයට පැමිණි) භාග්‍යවත් සර්‍වඥයන් වහන්සේ; යෙන, යම්තැනෙක්හි (වැඩවාසයකර වදාරනසේක්)ද; තෙන, එතැන්හි; උපසංකමි, එලඹියේය; උපසම්කමිත්වා, (එතැන්හි) එළඹ; භගවන්තං,(සතපුණ්‍යලක්ෂණ ධරත්වාදි භාග්‍යයෙන්යුත්)සර්‍වඥයන්වහන්සේට; අභිවාදෙත්වා, (මස්තකයෙන්) අභිවාදනයකොට; එකමන්තං නිසීදි, එක් පාශර්වයෙක්හි හුන්නෝය; එකමන්තං නිසින්නාඛො, එක්පාර්ශවයෙක්හි හුන්නාමවූ; මල්ලිකාදෙවී, (නෛකවිධශ්‍රද්ධාභිලාෂීවූ) මල්ලිකාදෙවී තොමෝ; භගවන්තං, (සුන්දරතරගුණ මන්දිරප්‍රතිභාගවූ) සර්‍වඥයන්වහන්සේට; එතදවොච, මේවක්ෂ්‍යමානප්‍රකාර වචනයෙන්) මෙසේ සැලකළසේක.

(3) ඉධපන, මේලොකයෙහිවනාහි; එකච්චොමාතුගාමො, සමහර ස්ත්‍රීයක්තොමෝ; යෙන, යම්කාරණයකින්; දුබ්බණ්ණාච, ඉතා දුර්වර්ණවන්නීද; දුරූපාච, දුෂ්ටවූරූප ඇත්තීද; සුපාපිකා දස්සනායච හොති,දර්ශනයට අප්‍රියතරවූ රූප ඇතිවන්නීද; දළිද්දාච, දිළිඳුවන්නීද; අප්පස්සකාච, වස්තුනැතිවන්නීද; අප්පභොගාච, අල්පභොගවන්නීද; අප්පෙසක්ඛාචහොති, අල්පෙශාක්‍යවන්නීද හෙවත් කිසි ආනුභාවක් නැතිවන්නීද; භන්තෙ, ස්වාමිනී; (සියපිත් ලකුනෙන්යුත් බුදුරජාණන්වහන්ස) කොනුඛො හෙතු, ඊටහෙතු කවරක්වන්නේද; කොපච්චයො, ඊටප්‍රත්‍යය කවරේද; ඉධ පන, මේලොකයෙහි වනාහි; එකච්චොමාතුගාමො, සමහර ස්ත්‍රීයක්තොමෝ; යෙන, යම්කාරණයකින්; දුබ්බණ්ණා ච හොති, දුර්වර්ණවන්නීද; දුරූපාච, නපුරුවූ රූපඇත්තීද; සුපාපිකා දස්සනාය ච හොති, පාපිෂ්ටවූ දර්ශනයට අප්‍රියතර රූපඇතිවන්නීද; මහද්ධනාච, (රන් රිදී මුතු මැනික් ආදිවූ) මහත් ධන ඇතිවන්නීද; මහාභොගාච, (ශාලිව්‍රීහි යව කඞ්ගුආදි) මහත්භොග ඇතිවන්නීද: අඩ්ඪාචහොති, සකල වස්තුවෙන් ආඪ්‍යවන්නීද; මහෙසක්ඛාච හොති, මහෙශාක්‍ය වන්නීද; භන්තෙ, ස්වාමිනි (සර්‍වමාර්වාරනුකෙසරීන්ද්‍රවූ) බුදුරජාණන්වහන්ස කොනුඛොහෙතු, ඊටහෙතු කවරේද; කොපච්චයො, ඊටප්‍රත්‍යය කවරේද—ඉධ පන, මේලොකයෙහි වනාහි; එකච්චොමාතුගාමො, සමහර වනිතාවක්තොමෝ; යෙන, යම්හෙතුවකින්; අභිරූපා ච හොති, (දර්ශනීයාභිරමණීයවූ) සහ

පත්ලක්ෂණ ඇතිවන්නීද; දස්සනීයාච, නෙත්‍රාභි නන්දනීය වන්නීද; පාසාදිකාච, ප්‍රාසාද ඇතිවන්නීද; පරමාය වණ්ණ පොක්ඛර තාය සමන්නාගතාච, උතුම්වර්ණ සෞන්දර්යයෙන්යුක්ත ශරීර ප්‍රභා ඇතිවන්නීද; දළිද්දාච හොති, දිළිඳුවන්නීද; අප්පස්සකාච, වස්තුනැති වන්නීද; අප්පභොගාච, ස්වල්ප භොගී වන්නීද; අප්පෙසක්ඛාච හොති, අල්පෙශාක්‍ය වන්නීද හෙවත් දර්ශන ශ්‍රවනජනයන් විසින් හෙළාදකුම් ඇතිවන්නීද; භන්තෙ, ස්වාමිනි බුදුරජාණන්වහන්ස; කොනුඛො හෙතු, ඊටහෙතු කවරේද; කො පච්චයො, ඊටප්‍රත්‍යය කවරේද—ඉධ පන, මෙලොකයෙහි එකාති; එකච්චා මාතුගාමො, සමහර ස්ත්‍රියක් නොමෝ, යෙන, යම් කාරණයකින්; අභිරූපාච හොති, (චිත්තප්‍රියකරවූ) යහපත් ලක්ෂණඇති වන්නීද; දස්සනීයාච, මනොඥවූ දර්ශනඇති වන්නීද; පාසාදිකාච, ප්‍රභාසම්පන්න ශරීරඇති වන්නීද; පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතාච, උතුම්වර්ණ සෞන්දර්යයෙන් සමන්නාගතවන්නීද, මහද්ධනාච, (රජත ස්වර්ණාදි) මහත්වස්තුවෙන්ද; මහාභොගාච, (ශාලිව්‍රීහිආදි) මහත් භොගයෙන්ද; අඩ්ඪාච හොති, (සකලවස්තුවෙන්) ආඪ්‍ය වන්නීද; මහෙසක්ඛාච, මහෙශාක්‍ය වන්නීද හෙවත් ජනයන්විසින් ඉතා ආදරසත්කාර ගරුකාරලැබීම් ඇතිවන්නීද; භන්තෙ, (සතපුණ්‍යලක්ෂණ ධරත්වාදි ගුණයෙන් යුක්තවූ) බුදුරජාණන්වහන්ස; කො හෙතු, ඊටහෙතු කවරේද; කො පච්චයොති, ඊටප්‍රත්‍යය කවරේදැයි; (යනාදීන් නෛකප්‍රශ්න ප්‍රච්ඡනාභිලාෂීවූ මල්ලිකාදෙවී නොමෝ මේ චතුර්විධ කාරණයන් මෙසේ විචාළ සේක).

4 මල්ලිකෙ, මල්ලිකාදෙවීනි; ඉධපන, මෙලොකයෙහි එකාති; එකච්චාමාතුගාමො, සමහර ස්ත්‍රියක්නොමෝ; කොධනාහොති, ක්‍රොධකරන්නීද; උපායාසබහුලා, ක්‍රොධවශයෙන් උපදවනලද බලවත් ආයාස ඇත්තීද; අප්පම්පිවුත්තාසමානා, ස්වල්පයකුදු කියනුලබන්නී; අභිසජ්ජති, බොහෝකොට තැතිගන්නීද හෙවත් ක්‍රොධවශයෙන් ඇලෙන්නීද; කුප්පති, (දණ්ඩත්පහළ අශීර්විෂයක්හුමෙන්) කිපෙන්නීද; ඛ්‍යාපජ්ජති, කෝපයෙන් ගැටෙන්නීද; පතිත්ථීයති, තැතිගන්නීද; කොපංච, කොපයද හෙවත් ක්‍රොධචෙතනාවද; දොසංච, වෙසයද; අප්පච්චයංච, නොසතුටුබවද හෙවත් චිත්තයාගේ අප්‍රසන්නතාවයද; පාතුකරොති, පහළකරන්නීද හෙවත් උපදවන්නීද; සමණස්සවා, (සමිතපාපීවූ) ශ්‍රමණයක් හටහෝ; බ්‍රාහ්මණස්සවා, (බාහිතපාපීවූ) බ්‍රාහ්මණයක්හටහෝ; අන්නං, (ශාලිව්‍රීහි කංගු කුද්‍රූස වරක ගොධුමයන සප්තවිධ ධාන්‍යයෙන් කරණලද) ආහාරවර්ගය; පානං, (මධු මුද්දිකාදි අෂ්ටවිධ) පානවර්ගය; වත්ථං, (ක්ෂෞම කොසෙය්‍යාදී නානාවිරාග) වස්ත්‍රය; යානං, (රථ ගැල් ඉදෙලි කුනම් ඇත් අස්ආදී) යානවාහනය; මාලා, (ගෙතූ නොගෙතූ සිනිද්ද

බෝලිද්ද දෑසමන්ආදිවූ) සුගන්ධ පුෂ්පය; ගන්ධ, (සඳුන් කපුරු කස්තූරි ආ දිවූ) සුගන්ධය; විලෙපනං, කොකුම් ජවාදු සඳුන් ගොරද ආදිවූ) ඡවිරාග කරණය; සෙය්‍ය, (තිසි චිම්ලිකාදී විචිත්‍රචිත්‍ර වස්ත්‍රඅතුරණලද) සයනය; ආවසථ, ආවාසය හෙවත් ලැගුම්ගෙය; පදීපෙය්‍යං, ප්‍රදීපයටහිතවූ (පහන් කදු පහන්මලා පහන්වැටි) පහන්තෙල්ආදිය: සා, ඕතොමෝ; නාදාතා හොති, (මාත්සර්‍යවශයෙන්) ප්‍රදානයනොකිරීම් සවභාවකොට ඇත්තීද; ඉස්සා මානිකාබොපනහොති, ඊර්ෂ්‍යා මානකරන්නීද; පරලාභ සක්කාර ගරුකාර මානනවන්දනා පූජනාසු; මෙරමා ලබන ලාභසත්කාර ගරුකා ර පූජනාදියෙහි; ඉස්සති, ඊර්ෂ්‍යාකරන්නීද; උපදුස්සති, (ඊර්ෂ්‍යාවශයෙන් බලවත්වූ) උපක්‍රොසකරන්නීද; ඉස්සංබන්ධති, (යව කලාපයක් බැඳුන් මෙන් බලවත්වශයෙන්) ඊර්ෂ්‍යාකරන්නීද; සෙ, ඉදින්වනාති; තතොචුතා, එයින් චුතවනලද්දී; ඉත්ථත්තං ආගච්ඡති, මෙහි යම්ආත්මයකට පැමි ණෙන්නීද; යත්ථයත්ථ පච්චාජායති, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදී) යම් යම් කුලයක උපදීද; සා, ඕතොමෝ; දුබ්බණ්ණාචහොති, දුර්වර්ණවත්නීය; දුරූපා, දුෂ්ටවූ රූපඇතිවන්නීය; සුපාපිකාදස්සනාය, දශීනයට අප්‍රියතරවූ කෘෂ් ණවර්ණ ඇත්තීය; දලිද්දාචහොති, දිළිඳුවන්නීය; අප්පස්සකා, වස්ත්‍ර නැතිවන්නීය; අප්පභොගා, අල්පභොගිවන්නීය හෙවත් යැපීමට නිසිවූ ඛාද්‍යභොජ්‍ය විකෘති නැතිවන්නීය; අප්පෙසක්ඛාචහොති, අල්පෙශාක්‍ය වන්නීය හෙවත් කිසිවක්හුවිසින් ආදරසත්කාරගරුකාර නොලබන්නීය;

මල්ලිකෙ; මල්ලිකාව; ඉධපන, මේලොකයෙහි වනාහි: එකච්චා මාතුගාමො, සමහර ස්ත්‍රියක්තොමෝ; කොධනාහොති, ක්‍රොධකරන්නීද; උපායාසබහුලා, (ක්‍රොධවශයෙන් උපදවනලද) බලවත් ආයාසඇත්තීද; අප්පම්පිවුත්තාසමානා, ස්වල්පයකුදු කියනුලබන්නී; අභිසජ්ජති, කොප යෙන් ගැටෙන්නීද හෙවත් ඇලේද; කුප්පති, (දණ්ඩෙන්පහළ ආශීර්විෂ යකුමෙන්) වහාකිපේද; බ්‍යාපජ්ජති, (කොපයෙන්) කලකිරේද; පති ත්ථීයති, (ක්‍රොධ චෙතනාව කරණකොටගෙණ) නැතිගනීද; කොපංච, කොපයද; දොසංච, වෙෂයද හෙවත් නොඉවසියහැකි චෙතනාවද; අ ප්පච්චයංච, නොසතුටුබවද; පාතුකරොති, පහළකරන්නීද හෙවත් උපද වන්නීද; සා, ඒ ස්ත්‍රීතොමෝ; සමණස්සවා, (පම්නපාපීවූ) ශ්‍රමණයක්හට හෝ; බ්‍රාහ්මණස්සවා, (බාහිතපාපීවූ) බ්‍රාහ්මණයක්හටහෝ; අන්නං, ඛාද්‍ය භොජ්‍ය විකෘතියද; පානං,, (අම්බපානං ජම්බපානං චොචපානං මොච පානං මධුපානං මුද්දිකපානං සාලූකපානං යනාදීන් දක්වනලද අෂ්ට විධ) පානවර්ගයද; වත්ථං, (ක්ෂෞම කොසෙය්‍යාදී විසිතුරුවූ) වස්ත්‍රය; යානං, (රථගැල් ඊදෝලි කුනම් ඇත් අස්ආදී) යානවාහනය; මාලං, (ගෙතූ නොගෙතූ සීනිද්ද බෝලිද්ද දෑසමන්ආදී) සුගන්ධ පුෂ්පය; ගන්ධ, (සඳුන් සුවඳ කපුරු ජවාදු පිනිදියආදී) සුගන්ධය; විලෙපනං, (චන්දනාග රු කොකුම්ආදී) ඡවිරාගකරණය; සෙය්‍යා, (තිසි චිම්ලිකාදී නෙකප්‍රකා

ර කම්බිලාසතරණ අතුරණලද සයනය; ආවසථං, (වාසස්ථානයට සුදු
සුවූ) ආවාසය හෙවත් ලැගුම්ගෙවල්ය; පදීපෙය්‍යං, ප්‍රදීපයටතිනවූ (පහන්
කඳු පහන්මලා පහන්වැටි) පහන්තෙල්ආදිය යන දශවිධ දානවස්තූන්
සා, ඕතොමෝ; දාතාහොති, ප්‍රදානයකිරීම ස්වභාවකොටඇත්තීද; අනි
ස්සාමානිකාචොපනහොති, ඊර්ෂ්‍යාමානනොකරන්නීද; පරලාභ සත්කාර
ගරුකාර මානනාවන්දනා පූජනාසු. අනුන්ලබන ලාභසත්කාර ගරුකාර
මානනාවන්දනාපූජනාවන් විෂයෙහි; නාඉස්සති, ඊර්ෂ්‍යානොකරන්නීද; න
උපදුස්සති, ඊර්ෂ්‍යාවශයෙන් උපක්‍රෝෂනොකරන්නීද; න ඉස්සංබන්ධති,
ඊර්ෂ්‍යානොබඳින්නීද; චෙ, ඉදින්වනාහි; තතොචුතා, එයින් චුතවන
ලද්දී; ඉත්ථත්තං ආගච්ඡති, මේමනුෂ්‍යාත්මභාවයට පැමිණේද; යත්ථයත්ථ,
යම්යම්තැනෙක්හි; පච්චාජායති, උපදීද; සා, ඕතොමෝ; දුරූපාච, දු
ෂ්ට නපුරුවූ රූපඇතිවන්නීය; සුපාපිකාදස්සනායච, දර්ශනයට අප්‍රියතර
වූ පාපිෂ්ඨවූ දෙහඇතිවන්නීය; දුබ්බණ්ණාචහොති, ඉතා දුර්වර්ණවත්
නීය; මහද්ධනාච, (කනකරජතාදි) මහත්වූ ධනඇත්තීය; මහාභොගාච,
මහත්වූ භොගසම්පත් ඇතිවන්නීය; අඩ්ඪාචහොති, සකල වස්තුවෙන්
ආඪ්‍යවන්නීය; මහෙසක්ඛාචහොති, මහෙසාක්‍යවන්නීය හෙවත් සියල්
ලන්විසින්කරණ ආදර සත්කාර ගරුකාර ලබන්නීය.

මල්ලිකෙ, (මාලාකාරජ්‍යෙෂ්ඨයාහට ධීතෘහෙයින්දෝහෝ නොහොත්
මාලාකාරස්ථානයෙහිදී දර්ශනයට සම්භවූ බැවින්) මල්ලිකානාම්වූ එම්බා
දෙවිනි; ඉධපන, මේලොකයෙහි වනාහි එකච්චො මාතුගාමො, සමහර
අඞ්ගනාවක්තොමෝ; අක්කොධනාහොති, ක්‍රොධනොකිරීමස්වභාවකො
ටඇත්තීද; අනුපායාසබහුලා, (උපායාසවශයෙන් උපදවනලද) බලවත්
ක්‍රොධ නැතිවන්නීද; බහුම්පිවුත්තාසමානා, බොහෝකොට යමක්කීකල්
හිද නොහොත් බොහෝ වරද දුටුකල්හිද; නාභිසජ්ජති, තැතිනොගන්
නීද; නකුප්පති, (බලවත්කොට) නොකිපෙන්නීද; නබ්‍යාපජ්ජති, නො
කලකිරෙන්නීද; නපතිත්ථීයති, ස්ථබ්ධනොවන්නීද; කොපංච, කොප
යද; දොසංච, ද්වෙෂයද; අප්පච්චයංච, නොසතුටුබවද; නපාතුකරොති,
පහළනොකරන්නීද; සමණස්සවා, (සමිතපාපීවූ) ශ්‍රමණයක්හටහෝ; බ්‍රා
හ්මණස්සවා, (බාහිතපාපීවූ) බ්‍රාහ්මණයක්හටහෝ; අන්නං, (ඛජ්ජභොජ්ජ
ලෙය්‍ය පෙය්‍ය යන චතුර්විධ) අහාරවගීය; පානං, මධුමුද්දිකාදි අෂ්ටවිධ)
පානවගීය; වත්ථං' (ක්ෂෞම කොසෙය්‍යාදි විසිතුරු) වස්ත්‍රය; යානං, (ඉ
දෝලිකුණම් ආදිවූ) යානවාහනය; මාලා, (සුමන චම්පකාදි ගෙතූ නො
ගෙතූ) පුෂ්පය; ගන්ධ, (සඳුන් කඳුරු කස්තුරිආදී) සුගන්ධය; විලෙපනං,
(කොකුම් ජවාදුආදි) ඡවිරාගකරණය; සෙය්‍ය, (හිසිච්මිලිකාදී නොයෙක්
ඇතිරිලි අතුරණලද) සයනය; ආවසථං, (වාසස්ථානයට සුදුසුවූ) ආවාස
ය හෙවත් ලැගුම්ගෙවල්ය; පදීපෙය්‍ය, ප්‍රදීපයට තිනවූ පහන්තෙල්ආදිය;

සා, ඒ අඟනාතොමෝ; නදාතාහොති, ප්‍රදානයනොකිරීම ස්වභාවකොට
ඇත්තීද; අනිස්සාමානිකාඛොපනහොති, ඊර්ෂ්‍යාමානනොකරන්නීද; පර
ලාභ සක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු, මෙරමාලබන ලාභසත්
කාර ගරුකාර මානනවන්දන පූජනාවන්විෂයෙහි, නඉස්සති, ඊර්ෂ්‍යානො
කරන්නීද; නඋපදුස්සති, ඊර්ෂ්‍යාවිසයෙන් උපක්‍රොසනොකරන්නීද; න
ඉස්සංබන්ධති, ඊර්ෂ්‍යානොබඳින්නීද; චෙ, ඉදින්වනාහි; තතොචුතා, එයින්
චුතවනලද්දී; ඉත්ථත්තං ආගච්ඡති, මේ මනුෂ්‍යාත්ම භාවයට පැමිණේද;
යත්ථ යත්ථ පච්චාජායති, (ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී) යම්යම් කුලයක උපන්නී
වීනම්; සා,ඒ ස්ත්‍රීතොමෝ; දුබ්බණ්ණාචහොති, ඉතාදුර්වර්ණවන්නීය; දු
රූපා, දුෂ්ටවූරූපඇති වන්නීය; අඩ්ඪාච, (සකල වස්තුවෙන්) ආඪ්‍යවන්
නීය; මහෙසක්කාච හොති, මහෙශාක්‍යවන්නීය හෙවත් බොහෝ ජන
යන් විසින් ආදරසත්කාර ගරුකාර ලබන්නිය—මල්ලිකෙ, මල්ලිකාදේවී
නි; ඉධ පන,මේලොකයෙහි වනාහි; එකච්චො මාතුගාමො,සමහර අඟ
නාවක් තොමෝ; අක්කොධනාහොති, ක්‍රොධනොකරන්නීද; අනුපායා
ස බහුලා, ක්‍රොධවශයෙන් උපදවනලද බලවත් ආයාස නැතිවන්නීද; බ
හුම්පි වුත්තාසමානා, බොහෝකොට සමත්කීකල්හිද; නොහොත්, බො
හෝ වරදක් දුටුකල්හිද; නාභිසජ්ජති, නැතිනොගන්නීද; නකුප්පති,
නොකිපේද හෙවත් (දණ්ඩෙන් පහළ ආශිර්විෂයක්හුමෙන්) නොකිපෙන්
නිද; නබ්‍යාපජ්ජති, නොකලකිරෙන්නීද හෙවත් සිත් කැලඹීමහා නැති
නොගන්නිද; නපතිත්ථීයති, නැතිගැනීම් වශයෙන් ස්ථබ්ධ නොවන්නිද;
කොපංච, කොපයද; දොසංච, ද්වෙෂයද; අප්පච්චයංච, නොසතුටුබවද;
න පාතුකරොති, පහලනොකිරීම ස්වභාවකොට ඇතිවන්නීද; සමණස්ස
වා, (සමිතපාපීවූ) ශ්‍රමණයක් හටහෝ; බ්‍රාහ්මණස්සවා, (බාහිතපාපීවූ) බ්‍රා
හ්මණයක් හටහෝ; අන්නං, ආහාරවර්ගය; පානං, අෂ්ටවිධ පානවර්ගය;
වත්ථං, (ක්ෂෞමකොසෙය්‍යාදි විචිත්‍ර) වස්ත්‍රය; යානං, (දෝලිකුණම්රථ
ගැල්ඇත් අස්ආදිවූ) යාන වාහනය; මාලා, (ගෙතූ නොගෙතූ සිනිඳු බෝ
ලිඳු සුමන චම්පකාදි) පුෂ්පය; ගන්ධං,(චන්දන කර්පූරාදි) සුගන්ධය; විලෙප
නං, (කුංකුම චන්දනා ගරුකාදි) ශරීරග කරණයට නිසි විලෙපනයද; සෙ
ය්‍යං, (හිසිව් මිලිකාදී නානාවිද වස්ත්‍ර අතුරණලද)සයනය; ආවසථං, ආවා
සය හෙවත් ලැගුම්ගෙය; පදීපෙය්‍යං, ප්‍රදීපයට හිතවූ පහන්තෙල් ආදිය;
සා, ඕතොමෝ; දාතාහොති, මෙකී දශවිධ දානවස්තුව ප්‍රදානය කරන්නී
ද——අනිස්සාමානිකා ඛොපනහොති; ඊර්ෂ්‍යාමාන නොකරන්නීද, පරලාභ
සක්කාර ගරුකාර මානනවන්දන පූජනාසු; අනුන් ලබන ලාභ සත්කාර
ගරුකාර මානන වන්දන පූජනාදියෙහි, නඉස්සති; ඊර්ෂ්‍යානොකරන්නීද,
න උපදුස්සති; ඊර්ෂ්‍යාවශයෙන් උපක්‍රොස නොකරන්නීද, න ඉස්සංබන්ධ
ති; ඊර්ෂ්‍යානොබඳින්නේද, චෙ; ඉදින්වනාහි තතොචුතා; එයින් චුතවන

ලද්දී, ඉත්ථත්තං ආගච්ඡති; මේ මනුෂ්‍යාත්ම භාවයට පැමිණේද, යත්ථය
ත්ථ පච්චාජායති; (ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදි) යම් යම් කුලයෙක්හි උපදීද, අභි
රූපාචහොති; (චිත්‍රානි නන්දනීයාවූ) යහපත් රූඇතිවන්නීය, දස්සනී
යාචහොති; දර්‍ශනයට ඉතා මනොඥවන්නීය, පාසාදිකාචහොති; ප්‍රභාස
ම්පණ්ණ ශරීරඇතිවන්නීය, පරමාය; උතුම්වූ, වණ්ණපොක්ඛරතාය සම
න්නාගතාහොති; යහපත් වර්‍ණශරීර සෞන්දය්‍යීයෙන් සමන්නාගතවන්
නීය, මහද්ධනාච; රන්රුවන් මුතුමැනික් ආදි වස්තු ඇතිවන්නීය, මහා
භොගාච; (ධාන්‍ය භොජ්‍යාදී) බොහෝසම්පත් ඇතිවන්නීය, අඩ්ඪාචහොති;
(සකල වස්තුවෙන්) ආඪ්‍යවන්නීය; මහෙසක්කාචහොති, මහෙශාක්‍යවන්
නීය, හෙවත් (බොහෝ ජනයන් විසින් ආදර සත්කාර ගරුකාර ලැබීම්
වශයෙන්) මහත්වූ ආනුභාව සම්පණ්ණවන්නීය;—මල්ලිකෙ, මල්ලිකා
දෙවීනි; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චාමාතුගාමො, සමහර
ස්ත්‍රියක් තොමෝ: යෙන, යම්කාරණයකින්; දුබ්බණ්ණාචහොති, දුර්වර්‍ණ
ශරීරඇතිවන්නීද; දුරූපාචහොති, දුෂ්ටවූරූපඇතිවන්නීද; සුපාපිකාදස්ස
නායචහොති, දර්‍ශනයටඅප්‍රියතරකෘෂ්ණවර්‍ණවන්නීද; දළිද්දාචහොති, ඉ
තාදිළිඳුවන්නීද; අප්පස්සකා, තමන්සතුවස්තුවිරහිතවන්නීද; අප්පභොගා
ච, අල්පභොගීවන්නීද; අප්පෙසක්ඛාච, අල්පෙශාක්‍යවන්නීද; අයංහෙතු,
මේඊටහෙතුවන්නේය; අයංපච්චයො, මේඊටප්‍රත්‍යය වන්නේය; මල්ලිකෙ,
මල්ලිකාදෙවීනි; ඉධපන, මේ ලොකයෙහි වනාහි; එකච්චොමාතුගාමො,
සමහර අඟනාවක්තොමෝ; දුබ්බණ්ණාචහොති, දුර්වර්‍ණවන්නීද; දුරූ
පාච, නපුරුවූශරීර ඇතිවන්නීද; සුපාපිකාදස්සනාය, ඉතාපාපී ලක්‍ෂණ
ඇතිවන්නීද; මහද්ධනාච, (රජත සවර්‍ණාදී)වස්තුඇතිවීමෙන්ද; මහාභො
ගාච, මහාභොගසම්පත් ඇතිවීමෙන්ද; අඪ්ඪාචහොති, ඊශ්වරවන්නීද;
මහෙසක්ඛාචහොති, මහත්වූ ආනුභාසම්පණ්ණවන්නීද; මල්ලිකෙ, මල්ලි
කාච; අයංපනහෙතු, මේවනාහි ඊටහෙතුවන්නේය; අයංපච්චයො, මේ
වනාහි ඊට ප්‍රත්‍යය කාරණාවන්නේය--

මල්ලිකෙ; මල්ලිකාදෙවීනි, ඉධපන මේ ලොකයෙහි වනාහි; එක
ච්චා මාතුගාමො, සමහර අඟනාවක්තොමෝ; යෙන, යම්හෙතුවකින්;
අභිරූපොහොති, යහපත් ලක්‍ෂණ ඇත්තීද; දස්සනීයාචහොති, දර්‍ශනය
ට සුදුසුවූ රූපඇතිවන්නීද; පාසාදිකාචහොති, ප්‍රසාදවන්නීද, හෙවත් ප්‍ර
භාසම්පණ්ණ ශරීරඇත්තීද; පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා
ච, උතුම්වර්‍ණ සෞන්දය්‍යීයෙන් යුක්තශරීරයෙන් සමන්නාගත වන්නී
ද; දළිද්දාචහොති, දරිද්‍රවන්නීද; අප්පස්සකාච, ධනනැතිවන්නීද; අප්ප
භොගාච, අල්පභොගීවන්නීද; අප්පෙසක්ඛාච, අල්පෙසාක්‍යවන්නීද; මල්
ලිකෙ, මල්ලිකාච; අයංපනහෙතු, මේවනාහි ඊට හෙතුවන්නේය; අයං
පච්චයො, මේවනාහි ඊට ප්‍රත්‍යයවන්නේය. මල්ලිකෙ, මල්ලිකාදෙවීනි;

ඉධපන, මේලොකයෙහි වනාහි; එකච්චාමාතුගාමො, සමහර අඟනාවක්නොමෝ; යෙන, යම්හෙතුවකින්; අභිරූපොහොති, යහපත් ලක්‍ෂණ ඇතිවන්නීද; දස්සනීයාච, යහපත් දර්‍ශනඇතිවන්නීද හෙවත් දුටුවන් පහදවන ශරීරඇතිවන්නීද; පාසාදිකාච, ප්‍රසාදවහවන්නීද හෙවත් ප්‍රභාසම්පන්න රූඇතිවන්නීද; පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතාච, උතුම්වර්ණ සෞන්දර්‍යයෙන් සමන්නාගතවන්නීද; මහද්ධනාච, (රන්රුවන්ආදි) මහත් ධනසම්පත් ඇතිවන්නීද; මහාභොගාච, මහත් භොග සම්පත් ඇතිවන්නීද; අඩ්ඪාචහොති, සියල්ලෙන්ම වැඩිතරම්වන්නීද; මහෙසක්ඛාචහොති, මහෙශාක්‍යවන්නීද හෙවත් මහානුභාව සම්පන්නවන්නීද; මල්ලිකෙ, මල්ලිකාදෙවීනි; අයම්පනහෙතු, මේවනාහි ඊටහෙතුවන්නේය; අයංපච්චයොති, මේවනාහි ඊට ප්‍රත්‍යයවන්නේයයි වදාළසේක.

(5) එවංවුත්තෙ, (ත්‍රිභුවනාධිපතිවූ භාග්‍යවත් බුද්ධරජාණන්වහන්සේ විසින්) මෙසේ වදාළකල්හි; මල්ලිකාදෙවී, (කොසොල්රජහුගේ අග්‍රමහෙසිකාවූ) මල්ලිකාදෙවීතොමෝ; භගවන්තං, (සමස්තකරුණා නිධානවූ) භාග්‍යවත් බුද්ධරජානන්වහන්සේට; එතදවොච, මේ (වක්‍ෂ්‍යමානප්‍රකාරයෙන් මෙසේ) සැලකෙළේය—භන්තෙ, ස්වාමීනි (සුන්දරතරගුණ මන්දිරවූ) බුද්ධරජාණන්වහන්ස; අහං, මම; යන්නූනං, ඒකාන්තයෙන්; අඤ්ඤංජාතිං, අන්ජාතියෙහි; කොධනා අහොසිං, ක්‍රොධකළාවෙමි; උපායාසබහුලා, ක්‍රොධවසයෙන් උපදවනලද බලවත් ආයාස ඇතිවූයෙමි; අප්පම්පිවුත්තාසමානා, ස්වල්පවචනයක් දුටුවෙම් හෙවත් ස්වල්පවරදක් දුටුවෙම්ද; අභිසජ්ජිං, කොපයෙන් ඝට්ටනාවීම්, හෙවත් ක්‍රොධයෙන් ලග්නවීම්; කුප්පිං, ක්‍රොධයෙන් කිපුනෙම්; බ්‍යාපජ්ජිං, කළකිරුනෙම්, හෙවත් ක්‍රොධයෙන් චිත්ත පූතිභාවයට පැමුණුනෙම්; පතිත්ථීයිං, තැතිගත්නෙම්, හෙවත් හැසිමිදුනු ගිතෙලක්මෙන් ක්‍රොධයෙන් දැඩිවූයෙමි; කොපංච, කොපයද; දොසංච, ද්වෙෂයද; අප්පච්චයංච, නොසතුටුබවද; පාත්වාකාසිං, පහළකෙළෙම්; භන්තෙ, ස්වාමිනි (සර්‍වලොකෙකනාථවූ) බුද්ධරජානන්වහන්ස; සා අහං, හේ මම; එතරහි, දැන්වනාහි; දුබ්බණ්ණා, දුර්‍වර්ණවූයෙම්; දුරූපා, නපුරුරූප ඇතිවූයෙනි; සුපාපිකාදස්සනාය, දර්‍ශනයට අප්‍රියතරවූ පාපිෂ්ට ලක්‍ෂණඇතිවූයෙම්--භන්තෙ, ස්වාමිනි බුද්ධරජාණන්වහන්ස; අහං, මම; යන්නූනං, ඒකාන්තයෙන්; අඤ්ඤංජාතිං, අන්‍යජාතිවල්හි; සමණස්සවා, ශ්‍රමණයන්හට හෝ; බ්‍රාහ්මණස්සවා, බ්‍රාහ්මණයන්හටහෝ, අන්නං, ඛජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යාදි චතුර්විධ ආහාරවර්‍ගය; පානං, අඹුමුද්දිකාදි අෂ්ටවිධ පානවර්‍ගය; වත්ථං, ක්‍ෂෞමකොසෙය්‍යාදි විසිතුරු වස්ත්‍රය; යානං, ඉදොල්තුනම්ආදි යානවාහනය; මාලා, සුමනචම්පකාදි පුෂ්පය; ගන්ධ, චන්දනකුංකුමාදි සුගන්ධය; විලෙපනං, සඳුන්අගරු

ජබාදු ආදි (විලෙපනය); සෙය්‍යං, නානාවිධ ඇතිරිලි අතුරනලද; (සය නය);ආවසථ,ආමාසය හෙවත් ලැගුම්ගෙය; පදීපෙය්‍යං,ප්‍රදීපයෙනමේ ද ශවිධදානවස්තුව; අදාසිං,ප්‍රදානය කෙළෙමි; භනෙත, සවාමිනි බුදුරජාණන් වහන්ස; සාඅහං, හේමම; එතරහි, දැන්වනාහි; මහඩනාව,(රන් රිදී මුතු මැනික් ආදි) වස්තුවෙන්ද; මහාභොගාච,(ශාලිව්‍රීහිආදී) භොගයෙන්ද; අඩ්ඪාච, ආඪ්‍යවූයෙම් හෙවත් ඊශ්වරවූයෙම්—භනෙත, (සියපින් ලකු ණෙන්යුත්) බුදුරජාණන්වහන්ස; සාඅහං, හේමම; යන්නූන, එකාගන යෙන්; අඤ්ඤං ජාතිං, මිටපළමු අන්‍යජාතියෙහි; අනිස්සාමානිකා අහො සිං, ඊෂ්‍යාමාන නොකෙළෙමි; පරලාභ සත්කාර ගරුකාර මානන වන්‍ද න පූජනාසු, අනුන් ලබන ලාභසත්කාර ගරුකාර වැඳීම් පිදීම් ආදියෙහි; නාඉස්සිං, ඊෂ්‍යානොකෙළෙමි; න උපදුස්සිං, ඊෂ්‍යාවශයෙන් උපද්‍රොහ නොකෙළෙමි; න ඉස්සංබන්ධිං, ඊෂ්‍යානොබැඳෙමි; භනෙත, සවාමිනි බු දුරජාණන්වහන්ස; සා අහං, හේ මම; එතරහි, දැන්වනාහි; මහෙසක්ඛා ච, මහෙශාක්‍යවූයෙම් හෙවත් බොහෝ ජනයාන්ගෙන් ආදරසත්කාර ගරුකාර ඇතිවූයෙම්; භනෙත, සවාමිනි බුදුරජාණන්වහන්ස; ඉමස්මිං රාජකුලෙ, මේ රාජවංශයෙහි; ඛත්තිය කඤ්ඤාපි, ක්ෂත්‍රිය කන්‍යාවෝයසිද; බ්‍රාහ්මණකඤ්ඤාපි, බ්‍රාහ්මණකන්‍යාවෝයසිද; ගහපති කඤ්ඤාපි, ගෘහපති කන්‍යාවෝයසිද; සන්තිඩොපන, විද්‍යමාන වන්නාහුද; තාසං, ඔවුන්ට; ඉස්සරාධි පච්චං කාරෙමි, ඉසුරුබවහා අධිපතිබව කරමි හෙවත් ඔවුන් මැඩපවත්වමි.

(6) භනෙත, සවාමිනි සර්වඥයන්වහන්ස; අහං, මම; අජ්ජතගෙග, අදපටන්; අකොධනා භවිස්සාමි, ක්‍රොධනොකරන්නෙමි; අනුපායාස බහුලා, ක්‍රොධවශයෙන් බලවත් ආයාස නූපදවන්නෙමි; බහුම්පිවුත්තා සමානා, බොහෝකොට යමක් කියනුලබන්නීද; නාභිසජ්ජිස්සාමි, ක්‍රොධ වශයෙන් සම්බන්ධනොවන්නෙමි; න කුප්පිස්සාමි, නොකිපෙන්නෙමි හෙ වත් ක්‍රොධචේතනා නූපදවමි; නබ්‍යාපජ්ජිස්සාමි, ක්‍රොධවශයෙන් නො ඇලෙන්නෙමි; න පතිත්ථියිස්සාමි, ක්‍රොධයෙන් තැතිනොගන්නෙමි; කො පංච, ක්‍රොධයද; දොසංච, වෙෂයද; අප්පච්චයංච, අසන්තුෂ්ටබවද; න පා තුකරිස්සාමි, පහලනොකරන්නෙමි—සමණස්සවා, (සමිතපාපීවූ) ශ්‍රමණ යන්හට හෝ; බ්‍රාහ්මණස්සවා, (බාහිතපාපීවූ) බ්‍රාහ්මණයන්හට හෝ; අ න්නං, (ඛජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍යාදි චතුර්විධ) ආහාරවර්ගය; පානං (මධු මුද්දිකාදි අෂ්ටවිධ) පානවර්ගය; වත්ථං, (ක්ෂෞමකොසෙය්‍යාදි නානා විධ) වස්ත්‍රය; යානං, (ඉදෝලිකුණම්ආදි) යාන වාහනය; මාලා, (සුමන චම්පකාදි) පුෂ්පය; ගන්ධ, (කස්තුරි කපුරුආදි) සුගන්ධය; විලෙපනං,(කො කුම් ජබාදු සඳුන් පිනිදිය ආදි) ඡවිරාග කරණයට සුදුසුවූ විලෙපනය; සෙය්‍ය, (විසිතුරු ඇතිරිලි අතුරණලද) සයනයට යොග්‍යවූ ආසනය: ආ

වසථ්, වාසයට සුදුසුවූ ආවාසය හෙවත් ලැගුම්ගෙය; පදීපෙය්‍යං, ප්‍රදීප
සට හිතවූ (පහන්වැටි පහන්තෙල් ආදීවූ) උපකරණය; දස්සාමි, මෙකී
දශවිධ දානවස්තුව ප්‍රදානය කරන්නෙමි; අනිස්සාමනිකා භවිස්සාමි, ඊර්ෂ්‍යා
මාන නොකරන්නෙමි; පරලාභ සත්කාර ගරුකාර මානන වන්දන පූජ
නාසු, අනුන්ලබන ලාභසත්කාර ගරුකාර වැඳීම් පිදීම් ආදියෙහි; න ඉ
ස්සිස්සාමි, ඊර්ෂ්‍යා නොකරන්නෙමි; න උපදුස්සිස්සාමි, ඊර්ෂ්‍යාවශයෙන් උප
ක්‍රොධ නොකරන්නෙමි; න ඉස්සං බන්ධිස්සාමි, ඊර්ෂ්‍යාබැඳුම් නැතිවන්නෙ
මියි දැන්වූයේය.

(7) භන්තෙ, ස්වාමීනි (සර්වමාර දුරිතවූ) සර්වඥයන්වහන්ස; අභික්කන්ත
න්තං, නුඹවහන්සේගේ ධර්මදෙශනාව ඉතා මනොඥය; භන්තෙ, ස්වා
මීනි බුද්ධරත්නයන්වහන්ස; අභික්කන්තං, නුඹවහන්සේගේ ධර්මදෙශනාව
නිසාවූ මගේ චිත්තප්‍රසාදය ඉතා යහපත; භන්තෙ, ස්වාමීනි (සකලසත්වා
භිමත ප්‍රදායක දිව්‍යද්‍රුමොපමවූ) සර්වඥයන්වහන්ස; සෙය්‍යථාපි, යම්සේ
පුද්ගලයෙක්; නික්කුජ්ජිතං, යටිකුරුකොට තබනලද යම්කිසි භාජන
යක්; උක්කුජ්ජෙය්‍යවා, උඩුකුරුකොට දක්වන්නේහෝවේද; පටිච්ඡ
න්නං, (තෘණපර්ණාදීයෙන්) ප්‍රතිච්ඡන්නවූ යම් වස්තුවක්; විවරෙය්‍යවා,
ප්‍රකාශකොට දක්වන්නේහෝවේද; මූළ්හස්ස, මන්මුලාවූ පුරුෂයක්හට;
මග්ගං ආචික්ඛෙය්‍යවා, (අතඇල්වාගෙන මේමග යවයිකියා) මාර්ග පෙන්
වන්නේහෝවේද; චක්ඛුමන්තො, අවිනෂ්ට චක්ෂුප්‍රසාදඇති පුරුෂයෙක්,
රූපානි දක්ඛින්තීති, (නීල පීතාදී) රූපයන් දකිත්යයි; අන්ධකාරෙ, (කෘෂ්
ණපක්ෂ චාතුර්දසී මධ්‍යම රාත්‍රි ඝණවනසණ්ඩ මෙඝපටලාවෘතවූ චතුරංග
යෙන් යුත්) ඝණාන්ධකාරයෙහි; තෙලපජ්ජොතං, ප්‍රසන්නවූ තිලතෛල
ප්‍රජ්වලිත ප්‍රදීපයක් හෙවත් තලතෙල්විලක්කුවක්; ධාරෙය්‍යවා, දරන්නේ
හෝවේද; එවමෙවං, මෙපරිද්දෙන්; භගවතා, (භග්නකරනලද රාගා
දාමීයන් ඇතිහෙයින්) භගවත්නම්වූ සර්වඥයන්වහන්සේවිසින්; අනෙක
පරියායෙන, නොයෙක් ප්‍රකාරයෙන්; ධම්මො පකාසිතො, (නවලොකො
ත්තර) ශ්‍රීසද්ධර්මදෙශනාකරනලද්දේය; එසාහං, හේ මම; භගවන්තංගො
තමං, ගෞතමගොත්‍රඇති සර්වඥයන්වහන්සේද; ධම්මංච, (සපර්‍යාප්තික
නවලොකොත්තර) සද්ධර්මරත්නයද; භික්ඛුසඞ්ඝඤ්ච, අෂ්ටාර්‍යපුද්ගල
සඞ්ඝයාද; සරණං ගච්ඡාමි, සරණපරායනවෙමි හෙවත් චිත්තාභිරති
යෙන් සෙවනාය භජනාය පර්යුපාසනායකෙරෙමි; භවං, (ස්වාමීනි සර්ව
සුරාසුර නරශ්‍රී පාලි නිසෙවිත පාදපඞ්කජොපසොභිතවූ) සර්වඥයන්වහන්
සේ; අජ්ජතග්ගෙ, අදපටන්; පාණුපෙතං, ජීවිතාන්තයදක්වා; සරණං
ගතං, සරණගියාවූ; මං, මා; උපාසිකං, උපාසිකාවක්මෙන්; ධාරෙතු
ඉති, සිත්හිලා දරාවදාරණසේක්වයි දැන්වූයේය.

මල්ලිකොවාද සූත්‍රසන්නය

නිමි.

# මෛත්‍රෙය වර්ණනාව.

මේ සූත්‍රාන්ත ධර්මදෙශනාව අසනු පිණිස පින්වත් සත්පුරුෂ ජනයන්විසින් බොහෝදවසක් මුළුල්ලෙහි උත්සාහ වීර්‍ය්‍යකිරීමෙන් දුරුසම්භාරාදිය සපයා මේ ධර්මශාලාව නාන්වා උඩුවියන්බැඳවා මලලොඹුඑල්වා ධර්මාසන පණවා වගුරලිපඩිනක්ෂත්‍රාදීන් විශෙෂයෙන් සරහා තැන්තැන්හි ප්‍රදීප දල්වා හාත්පසින් වටකොට ප්‍රදීප පන්තියෙන් සොභාමත්කරවා පූර්ණඝටතබා ලදපස්මල් ඉස ධර්මය කියන තැනැත්තන් කෙරෙහිද කරනලද සත්කාර සම්මාන ඇතිව සාදරයෙන් ආරාධනාකොට යථොක්තවූ සූත්‍රාන්ත ධර්මදෙශනාව කියවීමෙන් ශ්‍රද්ධා ප්‍රීතිඝනවූ අදහසින් ශ්‍රවණයකිරීම් ආදිවශයෙන් මේ ධර්මය කියවීමට මුලිකවූද මෙතැන්හි පැමිණියාවූද සත්පුරුෂ නොපහැමදෙනාවිසින් රැස්කරණලද මේ කුසලයාගේ ආනිශංස විශෙෂය මතුබුදුවන මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ විසින් සිව්වණක් පර්ෂත් මධ්‍යයෙහි මේ සත්වයෝ යටගියදවස ගෞතම බුදුන්ගේ සස්න පවත්නාකාලයෙහි ශුබාවතනාව පර්ණශාලා භොජනශාලා ධර්මශාලාදියකිරීමෙන් තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි බණපැවැත්වීමෙන් බොහොයේ පින්කම්කොට එතැන්පටන් මෙබඳු මෙබඳු දිව්‍ය මනුෂ්‍ය සම්පත් ආදිය විඳිමින් මාකරා ආවාහුයයි යනාදීන් වදාරණබවනම්හු අන්හිසිමක් හුවිසින් කියා නිමවාලිය නොහැකි ආනිශංස විශෙෂ ඇත්තේමය.

ඒ මෛත්‍රෙයබුදුන් උපදිනාපරිදි කෙසේදයත්.

මේ සස්න පංචප්‍රකාර අන්තර්ධානයෙන් අන්තර්හිතවූකල්හි මනුෂ්‍යයන්ගේ අධර්ම සමොධානයෙන් වර්ෂශතයෙහිසිටි ආයුෂය පිරිහී දශවර්ෂවූකල්හි මෘගසංවර්තියෙන් සත්වයෝ විනාශයට යෙති, එකල්හි ගහණ නිලීනව රැකුණු සත්වයන්ගේ ධර්මසමාදානයෙන් ආයුෂය ක්‍රමයෙන් වැඩිගොස් අසංඛ්‍යයට යෙයි, අසංඛ්‍යයෙහිසිටි ආයුෂය ක්‍රමයෙන් බැසිමින්ගොස් අසූදහසටයෙයි· එකල්හි දඹදිව්තෙලෙහි සුවාසූදහසක් නුවරින් පිරිවරණලද කෙතුමතීනම් නුවරෙක්වෙයි, දිගින් දොළොස්යොදුන්වෙයි, පුළුලින් සත්යොදුන්වෙයි, වටින් අටතිස්යොදුන්වෙයි, පොළොව පලානැගි සත්රුවන් පවුරු සතකින් නුවරහිසාරසිට රැ දවල් වෙනසක් නොදක්වා ප්‍රභාමත්කෙරෙති, සතරදිග සතරදිශාවෙහි සත්රුවන් වාසල් සතරක්මැවී සත්සත්මහල් ඇතිව රැදවල් වෙනසක් නොදක්වා නුවර අලඞ්කාර කෙරෙති, ඒ සතරවාසල්දොර කප්රුක් සතරක් පොළොවපලා පැනනැගි විචිත්‍රරූපසම්පත්තීන් පිරිනිබෙති, මුළුදඹදිව සත්වයෝ කැමතිකැමති වස්ත්‍රා

ගාරණ ඉන් එක් කප්රුකකින් ගෙණගියත් අසූදහසක්අවුරුදු මුළුල්ලෙහි
ඇඳ නිම්වාගත නොහැක්කේමය–ඒ කේතුමතීනම් රාජධානියෙහි දණ්
ඩෙන් පහින්කළ ගෙයක වසන්නාවූ එකද සත්වකෙනෙක්නැත, සත්රුැ
වන් ගෙවල්වලම වාසයකෙරෙති, දිව්‍යම්යවූ උයන්හා දිව්‍යමයවූ පොකු
ණෙන්හා ගැවසීතිබෙයි, එකල දඹදිව මුළුල්ලෙහි සත්වයන්ගෙන් සානා
කෙනෙක් වපූරණකෙනෙක් වෙළඳාම්කරණකෙනෙක්වත් බඩගිසා දුක්
ගන්නා එකද සත්වකෙනෙක්වත්නැත, පොළොව පලාගෙන ස්වයං
ජාතහැල් පැණනැගෙයි, ඒ කරල්වල කුඩුනැතිව මුතුදැල්සේ සාල්ගෙණ
තිබෙයි, එක්බිජුවටක් හුනුනැනින්නැගි පදුරෙහි කරල්කපා මැඩගත්කල
දෙදහස් දෙසිය දෙසැත්තැගැලක්පුරා සොළසාමුණු අටලාසක් සාල් ඉතී
රිවතිබෙයි, ඒ සාල් මැණික් උදුනෙහිනබා බත්පැසුනුකල හැමදෑම හැම
සත්වයෝම අනුභවකෙරෙති

ඒ නුවර සඞ්ඛනම් චක්‍රවර්තිරජෙක්වෙයි, ඒ රජහට නුවරමධ්‍යයෙහි
පස්විසියොදුන් රුවන් පහයෙක්වෙයි, එකල්හි දඹදිව්තලය දෙව්නුවරක්
සෙයින් විසිතුරුවෙයි, උතුරුකුරුදිව්යිනසෙයින් සුලභ අනාපාණවෙයි,

එකල්හි මෛත්‍රෙය බෝසතාණෝ තුසීපුරයෙන් සැවඅවුත් කෙතුම
තීනම් රාජධානියෙහි සංඛනම් චක්‍රවර්තිරජව අධිර්යෙන් ධර්මයෙන් අනු
ශාසනාකරන සුබ්‍රාහ්මණනම් පුරෝහිතයාපිණිස බ්‍රහ්මවතීනම් බිසවගේ
කුස පිළිසිඳගෙන දසමාසාවසානයෙහි අනෙකප්‍රකාර ප්‍රාතිහාර්‍ය්‍ය ශනස
හශ්‍ර දක්වමින් මවුකුසින් ප්‍රසූතව අජිතනම් කුමාරව වැඩිවියපැමිණ නළු
ගණ පිරිස් පිරිවරා පොළොවපලා පැනනැගි සිඩඞ්‍ර්‍ය චන්ද්‍රකය වර්ඩමා
නකය යන සත්රුවන් ප්‍රාසාදත්‍රයෙහි දිව්‍යමයවූ සම්පත් අනුභවකෙ
රෙමින් අටදහසක්අවුරුදු ගිහිගෙයි වාසයකොට චන්ද්‍රමුඛීනම් අගබිසව
කුසින් බ්‍රහ්මවඩ්නනම් පුත්රුවන උපන්ද, චතුර්විධ නිමිත්තදැක පැවිදිව
සහාශයක් ප්‍රධානයොගකොට චන්ද්‍රමුඛිනම් අගබිසවදුන් කිරිපිඩු වළඳා,
රුවන් පහයෙන්මගොස් දකුණුදෙසෙන්නැගී තුන්යලක් පැදකුණුකොට
අපරාජිතස්ථානයේ පැණනැගි රිදීකඳක්සේ සමව වටවූ එක්සියවිසිරියන්
කඳවෙයි, එපමණ පසුවමහාසාබා ඇති සාබාමණ්ඩලය වටින් සත්සියවිසි
රියන්පමණය, ඉඳුනිල්මිණි සේසතක්සේ ඇමදෑම සොභාමත්කරන්නාවූ
ඇමදෑම විලිකුන්ව වැගිරෙණ පතකුදුනැත, මුහුකළපත් ඉන්ද්‍රනීල මාණි
ක්‍යමයවූ පැහැඇති අසුඅස්සෙහි ලියහා අංකුර ප්‍රවාළමය පැහැඇති මුල
පටන් අගදක්වා මලින්සැදී සිටිනේය, දෙලොස්නැලියක් පැන්ගන්නා
පමණ කැකුළුඇති පිපිකල මහගැල්සක් පමණවෙයි, එකි එකි මලෙහි
නැලියක් නැලියක්පමණ රේණුවෙයි, එදා පිපි මල් අසූදහසක් අවුරුදු
පරනොවීත්බෙයි, ඒ බුදුන්ගේ පිරිනිවීමහාසමග ඇමමල්පරව නාවුවෙත්
ගැලවී පෙතතකුත් බිමනොහී ආකාශයෙත්ගොස් දරසැයෙහි වැහිර ඒ
බුදුන්හාසමග ආදෘහනවෙයි.

මෙබඳුවූ නාගශ්‍රී බොධියට පිටලා පැදුම්ලොව බලා වැඩහිඳ බුදුවෙත් ඒ බුදුන්ට අසොකය බ්‍රහ්මදේවය යන මහතෙර දෙදෙනෙක් අගසව්වෙති සිංහනාම් මහතෙර කෙණෙක් අග්‍රඋපස්ථායකවෙයි ඇමඳුම් දිවාරාත්‍රියෙහි පස්විසි යොදුන්නැන් පැතිරසිටිනා බ්‍යාමප්‍රභා මණ්ඩලය වන්නේය ඒ මෛත්‍රෙය බුදුන්ගේ බුද්ධකාය අසූඅටරියන් පමණ වන්නේය.

ශ්‍රීපාදයෙහි පටන් ජානුමණ්ඩලයට දෙවිසිරියන් උසය ජානුමණ්ඩලය පටන් නාභිමණ්ඩලයට දෙවිසිරියන් උසය නාභිමණ්ඩලයපටන් අක්‍ෂධාතුවට දෙවිසිරියන් උසය සිරෙධාතුව පස්විසිරියනය දෙබැම සගල පස්පස් රියනය දෙබැම් පස්රියනය නෙත්‍රසගල පස්පස්රියනය නාසිකාව සත්රියනය රන්වන්වූ කන්වැල්සගල සත්සත් රියනය ශ්‍රීහස්තදෙක සතළිස්රියන් පමණ වන්නේය එකිඑකී අතුල් පස්පස් රියනය ශ්‍රීපාදදෙක තෙළෙස්රියන් එක්විසත් සාඟුල් පමණ වන්නේය

මේආදි දෙතිස්මහා පුරුෂලක්‍ෂණයෙන් සමන්විතවූ සපරිවාර මාර පරාජයකොට දශසහශ්‍රී ලොකධාතුව එකපැහැර කම්පාකරවමින් ලොව්තුරා බුදුවනසේක.

මෙසේ ඒ ශ්‍රීමත්වූ බුද්ධකායකින් දම්සක් පැවතුම් සූත්‍රදේශනාකොට එතැන්පටන් තුන්ලෝවාසීන්ට සද්ධර්මාමෘත පානයකරවමින් සියලු සත්වයන් සංසාරයෙන් ගොඩනගා මෛත්‍රෙය බුදුහු අසූදහසක් අවුරුදු ආයුශ්‍රී වළඳනසේක.

ඒ මෛත්‍රෙය බුදුන් දක්නෝ කව්රුද නොදක්නෝ කවුරුද යත හොත් මාතෘඝාතක පිතෘඝාතක අරහන්තඝාතක ලොහිතුප්පාදක සඞ්ඝභෙදකයයි යන පංචානන්තරී කර්මය කළාහු ඒ මෛත්‍රෙය බුදුන් නොදක්නෝමය.

මෙලෝනැත පරලෝනැත කම්නැත කම්ඵලනැත මව්නැත පියන්නැත කළාවූ කුසලයෙහි විපාකනැතැයි කියා මෙසේ නියත මිථ්‍යාදෘෂ්ටි ගෙණ අල්ගා ඇවිදිනා සත්වයෝද ආර්‍යොපවාද කළාවූ සත්වයෝද නරකයෙහි ප්‍රේතයොනියෙහි අසුරකායෙහි අරූතල අසංඥතලයෙහි උපන්නාවූ සත්වයෝද ඉන්ද්‍රිය වෛකල්‍යයට පැමිණී සත්වයෝද ප්‍රත්‍යන්ත ජනපදයෙහි උපන් සත්වයෝද නිගණ්ඨාදී පාෂාණ්ඩයෝද බුදුන්සතුදෙය ධර්මය සතුදෙය සඞ්ඝසතුදෙය නොසසීත්ගෙණ කැවෝද ඒ මෛත්‍රෙය බුදුන් නොදක්නෝමය.

මෙසින් පිටත් අවශෙෂ සත්වයන්ගෙන් දුගීමගී යාචකයන්හා මහණබමුණන්ට දන්දුන්නෝ ඒ මෛත්‍රෙය බුදුන් දක්නෝමය.

පන්සිල් රක්‍ෂාකළෝද පෙහෙවස් රක්‍ෂාකළෝද බඹසරවස් රක්‍ෂාකළෝද දාගැප් කරවූවෝද, බොධිපිහිටෙව්වෝද පුෂ්පාරාම ඵලාරාමකරවූවෝද උයන් පොකුණු කරවූවෝද භොජනශාලා කරවූවෝද ලිත්කැපූ

ළෝද පින්පැන් හිබුවෝද බුදුසසුන් ඇතිකරන්ට වගල්වූවෝද ධර්මකථිකා යන්ට මණ්ඩපකරවා පිළිගැන්වූවෝද ඒ මෛත්‍රෙය බුදුන් දක්නෝමය.

ධර්මාසන කබලිබණ්ණවසුන් දුන්නෝද වීජිනිපත අනට්ඨසවා දුන් නෝද බණකියනානේ වියන් බැන්දෝද වියනෙහි මලලොඹු එල්වූවෝද බණකියන තෙසි පහන් දැල්වූවෝද බණට අඩගැසූවෝද ධර්මකථිකයන් පයසේදුවෝද යනාමේ සියලුම වතාවත්කොට නිමවා බණකියන්නන් ආචාර උපචාරයෙන් වඩාගෙණවුත් ධර්මාසනයෙහි වඩාහිඳුවා සකස්කොට බණපවත්වා බණඇසූවෝද ඒ මෛත්‍රෙය බුදුන් දකින්මය.

තවද, ආමිසදන ධර්මදානාදීන් සඞ්ඝයාවහන්සේට පූජාසත්කාර කාළෝද මවුන්ට උපස්ථානකළෝද පියන්ට උපස්ථානකළෝද කුලදෙටුවන්ට උපස්ථානකළෝද ලාබත් පොහොබත් අවදිබත් දුන්නෝද දැසපින් කිරියවත් පිරුවෝද සඞ්ඝාරාම කරවූවෝද පිළිමගෙවල් කරවූවෝද පිළිමකරවා ඇස්හිබුවෝද ඒ මෛත්‍රෙය බුදුන් දකින්මය

තවද, ඒ මෛත්‍රෙය බුදුන් දකින්වසි පනා යටත්පිරිසෙයින් එක මලක් එක පහනක් එක බත්ආලොපයක් පමණ දුන්නෝද ඒ මෛත්‍රෙය බුදුන් දක්නෝමය—අනුන්කළපින් සතුටුව ගත්තෝද ඒ බුද්ධොත්පාදයෙහිම උපදමෝවයි පනා කුසල්කළ ඒ දිව්‍යමනුෂ්‍යයෝ ඒ මෛත්‍රෙය බුදුන් දක්නෝමය—ඒ දිව්‍යමනුෂ්‍යයෝ ඒ මෛත්‍රෙය බුදුන්ගෙන් බණඅසා මාගීඵලයට පැමිණෙන්නාහ.

මාගීඵලයට පැමිණෙන්ට අසමර්ථකෙනෙක් සවර්ගයෙහි උපදනාහ—එබැවින් පින්වත් සත්පුරුෂයෙනි නොපමිසිනුදු ධර්මශ්‍රවණාදී වශයෙන් අදමෙතැන්හි රැස්කරනලද කුසලධර්මයන් වෙන්වෙන්කොට සිතූකල ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දැක්මට නියතවූ බොහෝ කුශල ධර්මයක්වණ බැවින්—පෙ—

මෛත්‍රෙය වංශනිමාව

නිමි.

### දම්සක්පැවතුන් සූත්‍රාරම්භයට

# සංග්‍රහයක්.

—※—

සකල සත්වයන් කෙරෙහි නිසලව පවත්නා විපුලවූ ප්‍රබල කරුණා ඇති හෘදකෝමදනොමඳින් ප්‍රබුද්ධවා ලොව්තුරා බුදුවූ “දීපසදිසං ආලොකං කරොන්තී දීපංකරෝ” යන්නෙන් දීපංකර නාම් බුදුරජාණන්වහන්සේ සුනන්ද නාම් උයන්හිදී දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ දෙව්මිනිසුන්ගෙන් සියක්කෙළන්දෙනා අමාමහනිවන් දුටුහ.

නවද ඊට ඉක්බිතිව බුදුවූ ගුණසණ්ඩමණ්ඩිත කොණ්ඩඤ්ඤ නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ දශකෙළක් භික්ෂූන් හා කෙළලක්ෂයක්දෙනා අමාමහ නිවන්දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ “අභිමඞ්ගල සම්මතජේතිනා මඞ්ගලො” යන්නෙන් විඥමලොහ අමඞ්ගලවූ මඞ්ගල නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ භික්ෂූන්ගෙන් තුන්කෙළක් හා කෙළලක්ෂයක් දෙන අමාමහ නිවන් දුටුහ.

නවද ඊට ඉක්බිතිව බුදුවූ හිමනපවන ලෙස විමල දම්දෙසන සුමන නාම් බුදුන් දිනකරකිරණ ප්‍රවර්ෂනගමෙඝ කාලයක් වැනි මෙඛලා නාම් උයන්හිදී දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ ලක්ෂයක් දෙන අමාමහ නිවන් දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ සඛම්සාගරමහා දයාකරුණා ගුණධාරභාරිත රෙවත නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්ෂයක් දෙන අමාමහනිවන් දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ සකල ලක්ෂණයෙන් ශොභිතවූ පූජිතගුණ ඇති සොභිත නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ අසඞ්ඛ්‍යයක්දෙන අමාමහනිවන් දුටුහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ අනොමක සත්වයන්ට මනොනුකූලවූ දහම්දෙසන ත්‍රිකාලදර්ශීවූ අනොමදර්ශී නාම් බුදුන් දම්සක් පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙලසියයක් දෙන අමාමහනිවන් දුටුහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ මුවරදෙහිවන් භෘඞ්ගයන්සේ රැව්නදින් යුත් පියුම්සිරිදුරු පදුම නාම් බුදුන් උදුලසිරිදුරු පාපවිනාවිජිත ධනඤ්ජය නාම් උයන වැඩහිඳ දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්ෂයක්දෙන අමාමහනිවන් දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ සාරගුණයෙන් විසාරදවූ නාරද නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ ලක්ෂයක්දෙන අමාමහනිවන් දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ ජනපරායණ ගුණදරාසිව් සෞම්‍යගුණ ඇති පියුමතුරා නාම් බුදුන් දම්සක් පැවතුන් සූත්‍රය දෙසූකලැ ලක්ෂයක් දෙන අමාමහනිවන් දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ අන්වර්ථනාමයෙන් ප්‍රසෙදවූ මජ්ඣමෙධසුමෙධ නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්ෂයක්දෙන අමාමහනිවන්දුටුහ—නවද ඊටඉක්බිතිව්බුදුවූසිරින් ගුණ ප්‍රතාපාලඞ්කෘත අනෙකාද්භූත ජාත සුජාත නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ අසූකෙලලක්ෂයක්දෙන නිවන් දුටහ—නවද ඊට ඉක්බිතිව බුදුවූ සර්වජනයන්ට අප්‍රියනොව ප්‍රියවඩන පියදස්සී නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්ෂයක්දෙන අමාමහ නිවන් දු

වන්——නවද ඊට ඉක්බිතිව බුදුවූ උභය ලොකාර්ථ සම්පාතිප්‍රදායක සර්වාර්ථ
දර්ශීවූ අත්ථදස්සී නාම් බුදුන් සර්වෝපමාවිරහිත ජනමනොකාම්වූ අනො
පම නම් උත්පත්ති වැඩහිඳ දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්‍ෂ
යක්දෙන අමාමහනිවන් දුටුහ——නවද සකලලොකවිඛ්‍යාත ධර්මචක්‍රයෙන්
නිම්මනොවන ජනයන්ට ඉම්මනොවන සිරිදෙන ධම්මදස්සී නාම් බුදුන්
දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්‍ෂයක්දෙන අමාමහ නිවන්
දුටුහ.

නවද සර්වාර්ථ සිද්ධිකරබුද්ධි ඇති සිද්ධාර්ථ නාම් බුදුන් දම්සක්පැවතුන් සූ
ත්‍රය දෙසූකලැ කෙළලක්‍ෂසියයක් දෙන අමාමහනිවන් දුටහ——නවද ස
මස්තජනනයනාමෘත රූපදර්ශනීයවූ උස්ව දහම්දෙසන තිස්ස නාම් බුදුන්
දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළසියයක් දෙන අමාමහනිවන් දුටු
හ——නවද සමස්තභුවනභාස්කර ත්‍රිභුවන දර්ශනීයවූ ඵුස්ස නාම් බුදුන් දම්
සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ ලක්‍ෂයක්දෙන අමාමහනිවන් දුටුහ——නව
ද මාරවීරවික්‍රම ගවෙෂණයෙහි තුෂාරපතිවූ තපස්ගුණඇති විපස්සී නාම්
බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ අසංඛ්‍යයක් දෙන අමාමහනිවන්
දුටුහ——නවද සකලශකාණ්නාදහනවූ නොකිලෙස ගුණෙන්යුත් දැකීමට
සිඛී නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ ලක්‍ෂයක්දෙන අමාම
හනිවන් දුටුහ——නවද සමස්තභුවනෛක තිලකවූ වෙස්සභූ නාම් බුදුන්
දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ කෙළලක්‍ෂයක්දෙන අමාමහනිවන් දු
ටුහ——නවද ඊට ඉක්බිතිව මෙකප බුදුවූ, මිදුනාවූ භවබන්ධනඇති දැකුම
ට සුදුසු සකිසඳ වැනිවූ කකුසඳ නාම් බුදුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූ
කලැ සතළිස්කෙළදහසක්දෙන අමාමහ නිවන් දුටුහ——නවද මානමදජ්
නකදලිකාණනවරවාරණභූත නානාගුණඇති කොණාගමන නාම් බු
දුන් දම්සක්පැවතුන් සූත්‍රය දෙසූකලැ තිස්කෙළදහසක්දෙන අමාමහනි
වන් දුටුහ——නවද සූක්‍ෂමවූ තීක්‍ෂණප්‍රඥාඇති කාශ්‍යප නාම් බුදුන් දම්සක්
පැවතුන් සූත්‍රය දෙසූකලැ විසිකෙළදහසක්දෙන අමාමහනිවන් දුටුහ——
නවද දෙව්පුරයහැර වැඩිය සව්සතුන් හට මව්ව ගෞතම නාම් බුදුරජා
නන්වහන්සේ බ්‍රහ්මාරාධනාව පිළිගෙන,

තතො ජපාලොදය පබ්බතෙ ජිනො මහප්පභො බුද්ධදිවාකරො තතො
මණිප්පභා සන්නිභ භාසුරප්පභො පමොචයං භාසුර බුද්ධරංසියො
නිරන්තරං නෙක මීජුපකූජිතං–සුඵුල්ල පඞ්කරුහ ගංධවාසිතං
ගතො යසස්සී මිගදාය මුත්තමං–තහිං තපස්සී වර පඤ්චවග්ගියා——

යනාදීන් වර්ණිනීයවූ ඉසිපතන අරම්හිදී දම්සක්පැවතුන් සූත්‍රය
දෙසූකලැ පස්වග මහණුන් ඇතුළුව අටලොස්කෙළක්දෙන අමාමහනි
වන් දුටුහ——

මෙසේ බුදුන්ගේ එකම සූත්‍රදෙශනාවකින් අසංඛ්‍ය ගණන් සත්ව
යන් නිවන්දුටුකලැ සතළොස්දහස් පන්සිය පන්සැත්තෑවක් සූත්‍රදෙශ
නාවන් දෙසූකලැ ඒ ඒ තන්හිදී නිවන්දුටු සත්වයෝ නම් නොකියහැක්
කාහුමය. එසේවූ ඒ සූත්‍රදෙශනාවන් අතුරෙන් අදමෙනැත්හි දම්සක්
පැවතුන් සූත්‍ර දෙශනාවෙහි සංක්‍ෂෙප අර්ථමාත්‍රයක් දක්වනුලැබේ——ඒ ධ
ර්ම මෙනැත්හි පැමිණියාවූ ශ්‍රද්ධාවන්තයන් විසින් නොනිදා, නොකොඳු
රා අවික්‍ෂිප්ත.චිත්තසන්තාන ඇතිව මතු ලබනලද නිවන් සලකා සාදර
යෙන් සද්ධර්මශ්‍රවණය කටයුතු.